# මොරටුව විශ්වවිද්‍යාලය – ශ්‍රී ලංකාව

## පුරප්පාඩු

මොරටුව විශ්වවිද්‍යාලයේ පුරප්පාඩුව පවතින පහත සඳහන් තනතුරු සඳහා අවශ්‍ය සුදුසුකම් සහිත අපේක්ෂකයින්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

### 01. ශිල්ප ප්‍රදර්ශක (II ශ්‍රේණිය) තනතුර

අවශ්‍ය සුදුසුකම්:

(I) යන්ත්‍රාණ/වායු පැස්සුම් ක්ෂේත්‍රයේ පළපුරුද්ද ලබා තිබිය යුතුය.

සහ

(II) විශ්වවිද්‍යාලයෙහි/රජයේ සේවයේ හෝ පිළිගත් ආයතනයක පුහුණු ශිල්පියෙකු ලෙස අවම වශයෙන් අවුරුදු 15 ක පළපුරුද්දක් තිබිය යුතුය.

හෝ

(III) විශ්වවිද්‍යාලයේ/රජයේ සේවයේ හෝ පිළිගත් ආයතනයක ඉහත (01) ඡේදයේ දැක්වෙන ක්ෂේත්‍රයේ පුහුණු විශේෂ ශ්‍රේණියේ තනතුරක අවම වශයෙන් අවුරුදු 03 ක පළපුරුද්දක් තිබිය යුතුය.

වයස : අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

වැටුප් ක්‍රමය : රු.21,932-17x213-25,553/-(මාසික) U-MN 1(III A)

** මූලික වැටුපට අමතරව ජීවන වියදම් දීමනාව හා අනෙකුත් අනුමත දීමනාවන්ද ගෙවනු ලැබේ.

### 02. යාන්ත්‍රික II ශ්‍රේණිය

අවශ්‍ය සුදුසුකම්:

(I) කියවීමට හා ලිවීමට හැකියාව තිබීම.

(II) පහත දැක්වෙන කරුණු පිළිබඳව හැකියාව තිබිය යුතුය.

(අ) පරිමාණයන් කියවීම, මයික්‍රොමීටර් සහ සූක්ෂම මාන සටහන් කියවීම.

(ආ) වාෂ්ප එන්ජින් යන්ත්‍ර සහ ඩීසල් පිරියත හා යන්ත්‍රෝපකරණ වල විශේෂිත සවි කිරීම් වර්ග හෝ කර්මාන්තශාලා ලියවන පට්ටල්, මිල්ලම් කිරීමේ යන්ත්‍ර සහ හැඩගාන යන්ත්‍ර ක්‍රියා කරවීමේ හැකියාව.

(ඇ) රූ සටහන් කියවීම හා තේරුම් ගැනීමේ හැකියාව.

(III) යාන්ත්‍රිකයෙකු හෝ යන්ත්‍ර ක්‍රියාකරවන්නෙකු වශයෙන් අවුරුදු 02 කට නොඅඩු පළපුරුද්දක් තිබිය යුතුය.

වයස : අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

වැටුප් ක්‍රමය : රු.21,356-16x192-24,428/-(මාසික) U-PL 3(III)

** මූලික වැටුපට අමතරව ජීවන වියදම් දීමනාව හා අනෙකුත් අනුමත දීමනාවන්ද ගෙවනු ලැබේ.

## 03. වාත්තුකරු 11 ශ්‍රේණිය

අවශ්‍ය සුදුසුකම්: (I) කියවීමට හා ලිවීමට හැකියාව.

(II) අඟලෙන් 1/64 දක්වා පරිමානයන් කියවීමේ හැකියාව, වාත්තුමල් සංකෝචන කෝදුව පාවිච්චි කිරීම, වාත්තු වැඩ සාමාන්‍යයෙන් මල බැදෙන සහ මල නොබැදෙන වාස්තු සඳහා වැලි මිශ්‍රණ කෝව පාවිච්චිය, වැලි ගම් වර්ග සහ වාස්තු මට්ටම් කිරීම, ලුම් ක්‍රමයට නල කෝව ලියවීම සහ ටෙම්පෙල්ඩ් භාවිතයෙන් කෝව සෑදීම, සැකිලි ක්‍රමයට කෝව පෙට්ටි සෑදීම, තෙල් සහ වැලි මිශ්‍රණ, එය පිළියෙල කර ගැනීම සහ වාත්තුවක් සඳහා කෝව සාදා ගැනීම ආදිය පිළිබඳ දැනුම තිබිය යුතුය.

(III) රජයේ දෙපාර්තමේන්තුවක,රාජ්‍ය සංස්ථාවක හෝ ඉංජිනේරු ආයතනයක කෝව සාදන්නකු වශයෙන් අවුරුදු 02 කට නොඅඩු පළපුරුද්දක් තිබිය යුතුය.

වයස : අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

වැටුප් ක්‍රමය : රු.21,356-16x192-24,428/-(මාසික) U-PL 3(III)

** මූලික වැටුපට අමතරව ජීවන වියදම් දීමනාව හා අනෙකුත් අනුමත දීමනාවන්ද ගෙවනු ලැබේ.

සම්පූර්ණ කරන ලද අයදුම්පත් 2017.08.25 වන දින හෝ ඊට පෙර ලැබෙනසේ මෙම විශ්වවිද්‍යාලයේ සහකාර ලේඛකාධිකාරී/ආයතන (අනධ්‍යයන) වෙත ලේඛනගත තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් බහා එවන කවරයේ වම්පස ඉහළ කෙලවරේ ඉල්ලුම් කරන තනතුර පැහැදිලිව සඳහන් කළ යුතුය.

තවද මේ සඳහා අදාළ ආදර්ශ අයදුම්පත්‍රය මෙම විශ්වවිද්‍යාලයේ ආයතන (අනධ්‍යයන) අංශයේ, සහකාර ලේඛකාධිකාරී නමට ලිපිනය ලියු රු. 40.00 ක මුද්දර ඇලවූ 25.5 සෙ.මි.x 10 සෙ.මි. ප්‍රමාණයේ ලිපි කවරයක් එවීමෙන් හෝ පැමිණ හෝ මොරටුව විශ්වවිද්‍යාලයේ www.mrt.ac.lk. වෙබ් අඩවිය මඟින් ලබාගත හැකිය.

උසස් අධ්‍යාපන ආයතනයන්හි, රාජ්‍ය දෙපාර්තමේන්තු, සංස්ථා සහ ව්‍යවස්ථාපිත මණ්ඩලවල දැනට සේවය කරන අයදුම්කරුවන් තම අයදුම්පත් අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානීන් මාර්ගයෙන් එවීමට කටයුතු කළයුතු වේ.

**ප්‍රමාද වී ලැබෙන, අවශ්‍ය විස්තර සඳහන් නොකළ, අපැහැදිලි හෝ වෙනයම් අවශ්‍යතාවයක් සපුරා නොමැති අයදුම්පත් දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. එසේ අයදුම්පත් ප්‍රතික්ෂේප කළ විට කුමන හේතුවක් නිසා වුවද එම අයදුම්පත නැවත සැළකිල්ලට භාජනය කරනු නොලැබේ.**

මෙම තනතුරු ලිඛිත/ප්‍රායෝගික/වෘත්තීය හා සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත කුසලතාවය පදනම් කරගෙන සුදුස්සන් බඳවාගනු ලැබේ.

වැඩ බලන ලේඛකාධිකාරී,
මොරටුව විශ්වවිද්‍යාලය,
මොරටුව.

2017.08.10